CENTRE FOR POLICY ALTERNATIVES
විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය
மாற்றுக் கொள்கைகளுக்கான நிலையம்

# යෝජිත විසිවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අභියෝග කිරීම සම්බන්ධයෙන් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයෙහි මැදිහත්වීම

***2018 සැප්තැම්බර් 12 වන දින*** - පාර්ලිමේන්තු මන්ත්‍රී විජිත හේරත් මහතා විසින් 2018 සැප්තැම්බර් 05 වන දින පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පතක් ලෙස පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට (පනත් කෙටුම්පත) එරෙහිව පාර්ලිමේනතු මන්ත්‍රී උදය ගම්මන්පිල මහතා විසින් ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරියේ පෙත්සමක් ගොනුකරන ද අතර ,විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහ එහි විධායක අධ්‍යක්ෂ පාක්‍යසෝති සරවනමුත්තු විසින් එම පෙත්සම සඳහා මැදිහත් වන ලදි.  මෙම යෝජිත පනත් කෙටුම්පත විධායක ජනාධිපති ධුරයේ සැළකිය යුතු සංශෝධන සිදුකිරීමට අපේක්ෂා කරයි. මෙකී පනත් කෙටුම්පතට අනුව ජනාධිපතිවරයා තවදුරටත් ආණ්ඩුවේ ප්‍රධානියා නොවන අතර පාර්ලිමේන්තුවේ සරළ බහුතරයකින් වසර පහක කාලයක් සඳහා තේරී පත්වනු ඇත.

මෙම පෙත්සම සම්බන්ධව විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයේ මැදිහත්වීම යනු විධායක ජනාධිපති ධුරය අහෝසි කිරීමේ අවශ්‍යතාවය සඳහා වූ දීර්ඝ කාලීන ස්ථාවරය යළි පුනර්ජනනය කිරීමයි. වර්ෂ 1994 සිට ශ්‍රී ලංකාවේ සෑම ජනාධිපතිවරයෙකු විසින්ම සිදුකරන ලද විධායක ජනාධීපතිධුරය අහෝසි කිරීමේ ප්‍රතිඥාව සඳහා ශ්‍රී ලාංකේය පුරවැසියන්ගේ අඛණ්ඩ සහාය ලබා ඇත.

විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය විසින් මෙම ස්ථාවරය වෙනුවෙන් පෙනී සිටින අතර, විධායක ජනාධිපති ධුරය අත්තනෝමතික හා ප්‍රජාතන්ත්‍රවිරෝධී ආකාරයෙන් විකාශනය කරන ලද 18 වන සංශෝධනය අභියෝගයට ලක්කරන ලද එකම සිවිල් සංවිධානය විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රයයි. එමෙන්ම 18 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය මගින් අත්තනෝමතිනව සහ ප්‍රජාතන්ත්‍ර විරෝධී ආකාරයට ලබාදුන් බලතල සීමා කිරීම සඳහා ගෙන එන ලද 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය සඳහාත් විකල්ප ප්‍රතිපත්ති කේන්ද්‍රය සහාය ලබාදෙන ලදි. වත්මන් ජනාධිපතිවරයා හා 2015 දී නිල වශයෙන් තෝරා පත්කරගන්නා ලද රජය විසින් සිදුකරන ලද එක් වැදගත් පොරොන්දුවක් වන විධායක ජනාධිපතිධුරය අහෝසිකිරීම ඉටුකරගැනීම සඳහා වූ වඩාත් ඵලදායී ප්‍රතිසංස්කරණයක් ලෙස මෙම 20 වන ව්‍යවස්ථා සංශෝධනය හඳුන්වා දෙන ලදි.

Centre for Policy Alternatives (Guarantee) Limited | 6/5, Layards Road, Colombo 5, Sri Lanka
Tel: ++94112081384, +94112081385, +94112081386 | Fax: +9411 2081388 | Email: info@cpalanka.org | Web: www.cpalanka.org